නාගරික සංවර්ධන අධිකාරිය - 2010
---------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මතය
-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව නාගරික සංවර්ධන අධිකාරියේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.2 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ. මෙම වාර්තාවේ 1.1.1 සහ 1.2 ජේදවලින් දක්වා ඇති කරුණු වලින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර නාගරික සංවර්ධන අධිකාරියේ හා එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනට එම ව්‍යාපාර සමූහයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

1.1.1 ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන
-----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගම් වූ ''යූඩීඒ රෙස්ට් හවුස් ලිමිටඩ්'', ''අර්බන් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ඩිවලොප්මන්ට් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්'' , ''පැලියගොඩ වෙයාර් හවුස් සමාගම'' , ''වෝටර්ස් එජ් ලිමිටඩ්'' යන ආයතනවල විගණනයට භාජනය නොකරන ලද කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණ අතර මේ හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිතාවය ප්‍රශ්නගත වේ.

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය 2006 වර්ෂයේ සිට දිගින් දිගටම අලාභ ලබමින් පවතින අතර සමාලෝචිත වර්ෂය අවසානයට අධිකාරියේ සමුච්චිත අලාභය රු.1,253,873,241 ක් වේ. එසේම සමාගම් සමූහයේ ශුද්ධ වත්කම් වල රු. 134,308,137ක සෘණ අගයක් පෙන්නුම් කරයි. අධිකාරියේ ශුද්ධ වත්කම් 2009 වර්ෂයට සාපේක්ෂව 151% කින් පිරිහීම හේතුවෙන් රජයේ මූල්‍ය සහයක් නොමැතිව අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම අවදානම් බව නිරීක්ෂණය විය.

## 1. 2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

---------------------------------------

### 1.2.1 ණයකර නිකුතුව

------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

කොළඹ නගරයේ පැල්පත් වාසීන්ට ස්ථිර නිවාස 60,000 ක් ඉදිකිරීමේ ජාතික වැඩපිළිවෙලට අරමුදල් සපයා ගැනීමේ අරමුණින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2010 ඔක්තෝබර් මසදී රුපියල් බිලියන 10 ක අවුරුදු 5 කින් ආපසු මිලදී ගත යුතු ණයකර නිකුත් කර තිබූ අතර එවා ආපසු ගෙවීම් හා වර්ෂ තුනක කාලයක් දක්වා පොලී වෙනුවෙන් මහා භාණ්ඩාගාරය ඇප වී තිබුණි.

(අ) මෙම ණයකර සඳහා 10% සිට 11% දක්වා වූ සහ පාවෙන අනුපාතය +0.75% ක වාර්ෂික පොලියක් ගෙවිය යුතු අතර 2010 වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු එම පොලී මුදල රු.264,835,293 කි.

(ආ) ඉහත පොලී අනුපාත යටතේ ණයකර නිකුතුවෙන් ලබාගත් රුපියල් බිලියන 10 ක මුදල අපේක්ෂිත කාර්යයට යොදවා ගන්නා තෙක් 2010 වර්ෂය තුල වාර්ෂිකව 7% පොලී අනුපාත යටතේ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර තිබුණි.

(ඇ) අධිකාරිය විසින් ණයකර නිකුත් කිරීමෙන් රුපියල් බිලියන 10 ක මුදලක් ලබාගෙන ආයෝජනය කිරීම තුලින් 2010 දෙසැම්බර් 31 දිනට රු.237,362,511 ක ආදායමක් උපයාගෙන තිබුණ අතර එදිනට ගෙවිය යුතු ණයකර පොලී රු.264,835,293 ක් විය. ණයකර නිකුත් කිරීමෙන් ලබාගත් මුදල් එලෙස අඩු පොලියකට ආයෝජනය කිරීම නිසා රු.27,472,782 ක අලාභයක් දැරීමට අධිකාරියට සිදුවී තිබුණි. 2010 ඔක්තෝබර් 05 දින සිට 2010 දෙසැම්බර් 31 දක්වා එලෙස ලැබූ දෛනික සාමාන්‍ය අලාභය රු.315,779 ක් ලෙස නිරීක්ෂණය විය.

(ඇ) තවද අදාල අමාත්‍ය මණ්ඩල තිරණය අනුව ණයකර හිමියන් වෙත ගෙවිය යුතු පොලී මුදල් වෙනුවෙන් මහාභාණ්ඩාගාරය ඇප වී ඇත්තේ සංවර්ධනය කිරීමට අපේක්ෂිත ඉඩම් හා ව්‍යාපෘති වලින් අධිකාරිය ආදායම් ලබන මට්ටම දක්වා වූ වර්ෂ තුනක කාලයක් සඳහා පමණි. එහෙත් ණයකර නිකුත් කර සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා එම මුදල් ප්‍රයෝජනයට ගෙන අදාල කටයුතු ආරම්භ කර නොතිබුණි. කෙසේ වෙතත් 2011 ජුලි වන විට රුපියල් මිලියන 871 ක් අදාල ව්‍යාපෘති 5 ක් සඳහා වැයකර තිබුණි.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

පහත සඳහන් ගණම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත්කර තිබුණ පාලන ගිණුම් 06 ක රු. 1,464,029 ක් හඳුනා නොගත් ශේෂයන් ලෙසද පාලන ගිණුම් 10 ක රු.55,712,576 ක විවිධ ශේෂයන් ලෙසද පෙන්වා තිබුණු නමුත් එම ශේෂයන්ගේ අනන්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි.

(ආ) නියැදි විගණන පරීක්ෂාවකදී ණය පදනම මත රු.95,345,851 ක සංවර්ධන බලපත්‍ර නිකුත් කර තිබු බව අනාවරණය වුවද අධිකාරිය විසින් 2010 වර්ෂය සඳහා විගණනය වෙත ඉදිරිපත් කළ අවසන් මූල්‍ය ප්‍රකාශන වල ණය පදනම මත නිකුත්කර ඇති සංවර්ධන බලපත්‍ර සඳහා ලැබිය යුතු ගාස්තු සහ පොලී පිළිබඳ තොරතුරු සටහනක් මගින් අනාවරණය කර නොතිබුණි.

(ඇ) විවිධ ව්‍යාපෘතින්ට අදාලව ජාතික ගෙඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නාගරික සංවර්ධන අධිකාරිය වෙත සැපයු උපදේශන සේවා වෙනුවෙන් 1999 සිට 2010 දක්වා කාලය තුල රු.11,750,827ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගෙවිය යුතුව තිබුණද මෙම මුදල සඳහා ගිණුම් වල ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. කෙසේ වෙතත් ඇතැම් කාර්යයන් කෙටුම්පත් ගිණුම් සකසන විටත් සහතික කර නොතිබු හෙයින් සහ අදාල අමාත්‍යාංශයෙන් මුදල් නොලැබී තිබු නිසා ගිණුම් ගත නොකල බව පාලනාධිකාරිය දැනුම් දී ඇත.

### 1.2.3 නොසැසඳු ගිණුම්

---------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) පාලන ගිණුම් 08 ක් හා ඒ හා සම්බන්ධ උපයෝගී වාර්තාවල දැක්වෙන ශේෂයන්ගේ එකතුන් අතර රු.10,984,757 ක ශුද්ධ වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) හිටපු තානායම් කලමණාකරුවන්ගේ හිඟ ශේෂය, තානායම් කලමනාකරණ අංශය විසින් ඉදිරිපත් කල උපලේඛනයට අනුව එය රු.38,500,363 ක් වුවද, ගිණුම් අංශය විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව එම හිඟ ශේෂය රු.20,387,022 ක් වුයෙන් රු.18,113,340 ක වෙනසක් අනාවරණය විය.

(ඇ) ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.3,750,639,423 ක් ලෙසද වෙළඳ තොගය රු.1,054,269,198 ක් ලෙසද මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණු අතර එම වටිනාකම් පිළිබඳව විස්තරාත්මක උපලේඛනය පරීක්ෂා කිරීමේදී එම උපලේඛනයන්ට ඇතුලත් කර ඇති ඇතැම් විෂයයන් එලෙස වත්කම් ලෙස ගණනය කල නොහැකි ඒවා බව අනාවරණය වුයෙන් ඉහත වටිනාකම් පිළිබඳ විගණනයේදි සැහීමකට පත් වීමට නොහැකි විය.

(ඈ) අවසන් මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු වටිනාකම, රු.136,289,125 ක් ලෙස දක්වා තිබුණද ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් ලද සනාථ කිරීම් අනුව නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුත වටිනාකම රු.135,443,965 ක් වුයෙන් රු.845,160 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) මූල්‍ය ප්‍රකාශන අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන ලැබිය යුතු මුදල රු.33,944,640 ක් ලෙස දක්වා තිබුණද , ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් ලද තහවුරු කිරීම් අනුව රු.51,843,285 ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් අයවිය යුතු වේ. අදාල නොගැලපීම් ඉවත් කර ගැනිම සඳහා නිවාස සංවර්ධන අධිකාරිය සමඟ එකඟතාවයකට පැමිණිමට කටයුතු කරමින් පවතින බව පාලනාධිකාරිය විසින් දැනුම් දි ඇත.

1.2.4 **පැහැදිලි නොකළ වෙනස්කම්**

--------------------------------

විගණනයට ඉදිරිපත් කර තිබුණු තොරතුරු අනුව ගිණුම් 11 කට අදාලව වර්ෂ කිහිපයක සිට පැවත එන ඍණ ශේෂවල එකතුව රු. 69,005,800 ක් හඳුනාගෙන ගිණුම් වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතුකර නොතිබුණි.

1.2.5 **ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 2 සිට 5 දක්වා සහ වර්ෂ පහට වැඩි කාලයක සිට නිරවුල් නොවී හිඟව පවතින අධිකාරිය විසින් ලබාදී ඇති විවිධ අත්තිකාරම් ශේෂ වල එකතුව පිළිවෙලින් රු.4,693,476 ක් හා රු. 5,059,102 ක් විය.

(ආ) 2010 දෙසැම්බර් 31 දිනට බාහිර ව්‍යාපෘති වලට අදාල ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගත යුතුවූ වර්ෂ 02 සිට 05 දක්වා සහ වර්ෂ පහට වැඩි කල්ගත වූ හිඟහිටි ශේෂයන්ගේ එකතුව පිළිවෙලින් රු. 668,138,404 ක් හා රු.656,443,850 ක් විය.

(ඇ) බාහිර ව්‍යාපෘතිවලට අදාල ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුලු ශේෂය වු රු.1,944,764,835 තුල රු. 11,042,550 ක් වු අසාමාන්‍ය බැර ශේෂයක් ඇතලත් වුවද එය හඳුනාගෙන ගිණුම් වල අවශ්‍ය ගැලපීම් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) ණයහිමි ශේෂයන්ට අදාලව වර්ෂ 2 සිට 5ට වැඩි කාලයක සිට නිරවුල් නොකර පවතින ශේෂයන්ගේ එකතුව රු.15,348,053 ක් විය.

(ඉ) 2010 දෙසැම්බර් 31 දිනට කොළඹ මධ්‍යම සුපිරි වෙළඳ සැල් සංකීර්ණය ඇතුලු අනිකුත් වෙළඳ සංකීර්ණ වලින් අයකර නොගෙන වර්ෂ 1 සිට 5 දක්වා හිඟව පවතින කුලී ආදායම රු.440,683,235 ක් විය.

(ඊ) 2010 දෙසැම්බර් 31 දිනට සේවක ණය ගිණුම තුළ එකතුව රු.1,256,554ක අක්‍රිය ණය ශේෂ එකතුවක් නිරීක්ෂණය විය.

(උ) 2010 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි නිවාසකුලී ආදායම ලෙස රු.34,217,283 ක් පැවති අතර එය මුළු කුලී කරුවන්ගෙන් 60%කට අධික විය. මේ තුල වර්ෂ 20 කට වැඩි කාලයක සිට හිඟව පවතින කුලී ආදායම්ද වු අතර එම මුදල් අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ඌ) දඹුල්ල නව නගර සැලසුම් යෝජනා ක්‍රමයට අදාලව අධිකාරියට අයත් දේපල පරිහරණය කරන්නන් (පදිංචිකරුවන්) විසින් පරිහරණ ගාස්තු ගෙවිය යුතු අතර හිඟ පරිහරණ ගාස්තු සඳහා 5% ක මාසික දඩ මුදලක් ද අයකරගත යුතුවේ. 2010 දෙසැම්බර් 31 දිනට එලෙස අධිකාරියට අයවිය යුතු හිඟ මුදල රු. 69,137,692 ක් වූ අතර මෙම දේපල පරිහරණය කරන්නන් 62 අතුරින් 4 දෙනෙකුගෙන් පමණක් අදාල පරිහරණ ගාස්තු හා දඩ මුදල් අයකර ගැනීමට අධිකාරිය කටයුතුකර තිබුණි.

(එ) අවසන් කල කුලි (Terminated Tenants) වටිනාකම ලෙස දක්වා ඇති රු.96,451,810 ක හිඟකුලී ශේෂය අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබූ අතර එම ශේෂය තුල රු.2,629,550 ක අසාමාන්‍ය ඍණ ශේෂයක්ද පැවතුණ.

(ඒ) ක්‍රීඩා අමාත්‍යාංශය වෙතින් අධිකාරියට ලැබිය යුතු මුදල් ලෙස රු.84,683,449 ක් මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා තිබුණද එම අගය සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඔ) වාර්මස් ගබඩා සංකීර්ණයෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව කුලියට ගෙන තිබූ ගබඩා වෙනුවෙන් 1995 පෙබරවාරි 25 දින සිට 1998 අගෝස්තු 15 දින දක්වා කාලය සඳහා රු.1,635,276 ක මුදලක් අයවිය යුතු බව අධිකාරිය විසින් 2008 මැයි 08 දින එම සංස්ථාවට දන්වා තිබුණි. 2010 දෙසැම්බර් 31 දින දක්වා එම ණය අයකර ගැනීම සඳහා ඵලදායි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඕ) වාර්මස් සංකීර්ණයේ පුද්ගලික සමාගමකට කුලියට දී ඇති කඩකාමර වලින් අධිකාරියට අයවිය යුතු හිඟ කුලීය 2010.08.31 දිනට රු.1,300,315 ක් වූ අතර මෙම සමාගම දැනට පවත්වා ගෙන නොයන බව නිරීක්ෂණය විය. මෙම හිඟ මුදල අයකර ගැනීමේ පසුවිපරම් කර නොතිබුණි.

(ක) විත්තම්පලම් ඒ ගාඩිනර් මාවතෙහි පිහිටි ගොඩනැගිල්ලක සමුපකාර අලෙවිසැලක් පවත්වාගෙන ගොස් තිබූ අතර රු.365,936 ක හිඟ කුලී 2010 දෙසැම්බර් 31 දක්වා අයකර නොමැති අතර 2009 වසරෙන් අනතුරුව පසු විපරමක් සිදුවී නොතිබුණි.

(ග) ජාතික කඩදාසි සමාගම විසින් 1990.05.01 දින සිට 2003.06.13 දින දක්වා වාර්මස් ගබඩා සංකීර්ණයෙන් කුලියට ගෙන තිබූ ගබඩා වෙනුවෙන් කුලී ලෙජරයට අනුව අයවිය යුතු මුදල රු.10,680,648 ක් විය. 2010 දෙසැම්බර් 31 දින දක්වා මෙම මුදල අයකරගෙන ඇති බවට තොරතුරු නොවීය.

1.2.6 **නීති රීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

-----------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 8.3.3 වගන්තිය සහ 2010 දෙසැම්බර් 14 දිනැති අංක 42 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | අලාභ ලබන ආයතනයක් ලෙස අධිකාරිය ප්‍රසාද දීමනා ගෙවනු ලබන්නේ නම්, එය රු1000 කට සීමා විය යුතු හෙයින් ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැකිව තිබුණේ රු.1,571,000 ක් වුවද, අධිකාරිය විසින් 2010 වර්ෂය සඳහා රු.9,579,000 ක් ප්‍රසාද දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණි. |
| (ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5 ඡේදය | ආරක්ෂක සේවා ලබා ගැනීම වෙනුවෙන් 2010 වර්ෂය තුල රු. 4,032,000ක මුදලක් විධිමත් ගිවිසුමක් අත්සන් කිරීමක් නොමැතිව සී/ස රකනා ලංකා ආරක්ෂක සමාගමට ගෙවා තිබුණි. |
| (ඇ) 1987 සැප්තැම්බර් 30 දිනැති සැලසුම් චක්‍රලේඛ 8 හා 1993 නොවැම්බර් 18 දිනැති සැලසුම් චක්‍රලේඛ 15 | රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයට අදාල පලාත්පාලන ආයතන 6 ක් විසින් අධිකාරියේ සේවාගාස්තු ආදිය තැන්පත් කිරීමට බැංකු ගිණුම් විවෘතකර ගෙන නොතිබුණි. |
| (ඇ) 1991 ජුනි 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ අංක මුදල් 295 හා 1997 ජනවාරි 24 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 116 | මෙම චක්‍රලේඛයට පටහැනව වෙනත් ආයතන වෙත නිලධාරීන් 14 දෙනෙකු නිදහස්කර තිබු අතර එම නිලධාරීන් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් වැටුප් ලෙස රු.5,733,448 ක් සමාලෝචිත වර්ෂයේදි ගෙවා තිබුණි. |
| (ඉ) 2008 අගෝස්තු 23 දිනැති අංක 1459/20 දරණ ගැසට් නිවේදනය | අංක 562/03 පහල බගතලේ කොළඹ 03 දරන ස්ථානයේ ගොඩනැගිල්ලේ අමතර මහල් දෙකක් ඉදිකිරීම සඳහා අය කල යුතු 1% සේවා ගාස්තුව |

| | |
|---|---|
| | අයකර ගෙන නොතිබුණු අතර 1999 සහ 2008 (සංශෝධිත) කොළඹ නගර සංවර්ධන සැලැස්මට අනුව සංවර්ධන කටයුතු නොකිරීම නිසා අයකළ යුතු දඩ මුදල් හා අනෙකුත් සේවා ගාස්තු අයකරගෙන නොතිබුණි. |
| (ඊ) 1999 හා 2008 සංශෝධිත කොළඹ නගර සංවර්ධන සැලැස්ම | මෙම සැලැස්මට පටහැනිව ඉදිකල පුද්ගලික සමාගමකට අයත් ගොඩනැගිලි දෙකක් සඳහා අයකර ගත යුතු 10% දඩ මුදල් අයකර ගෙන නොතිබුණි. |
| (උ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) 9.3.1.viii හා 9.10 වගන්තිය | මෙම චක්‍රලේඛයට පටහැනිව අධිකාර්ය විසින් විශ්‍රාමික නිලධාරීන් 04 දෙනෙනකු අමාත්‍ය මණ්ඩල අනුමැතියකින් තොරව නැවත කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. |
| (ii) 9.2 සී වගන්තිය | අධිකාර්යේ අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති තනතුරු 20 ක් සඳහා නිලධාරීන් පත් කර තිබුණි. |
| (iii) 9.2 ඩී වගන්තිය | කාර්ය මණ්ඩල සංයුතිය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iv) 9.3.1 වගන්තිය | අධිකාර්යේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව තනතුරුට අදාල නිශ්චිතව සපුරාලිය යුතු සුදුසුකම් නොමැති නිලධාරියකු තනතුරකට පත්කර තිබුණි. |
| (v) 8.3.3(අ) සහ 6.5 වගනතිය | වාර්ෂික වාර්තා සභාගත කර නොමැතිව ප්‍රසාද දීමනා ගෙවිය නොහැකි වුවද ඊට පටහැනිව 2004 වර්ෂයෙන් පසුව වාර්ෂික වාර්තා සභාගත කර නොතිබියදී ප්‍රසාද දීමනා ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඌ) 1991 ඔක්තෝබර් 08 දිනැති පර්පාලන කොට්ඨාශ චක්‍රලේඛ අංක 06/91 | මෙම චක්‍රලේඛයේ පිළිවෙත් වලට පටහැනිව නිලධාරීන් 40 දෙනෙකුට උසස්වීම් ලබා දී තිබුණි. |
| (එ) ICTAD/SDB/04 III වැනි පරිච්ඡේදයේ 4.13 හා 14.3 වගන්තිය | අධිකාරිය විසින් රජයේ ඉදිකිරීමකට අදාලව උපදේශන සේවා සැපයීමේදී ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා බිල්පත් 6 කට රුපියල් මිලියන 55.98 ක මුදලක් ගෙවීම නිර්දේශ කිරීමේදී ප්‍රගති වාර්තා හෝ ඉදිරිපත් කර නොතිබීම සම්බන්ධව සැලකිල්ල දක්වා නොතිබුණි. කෙසේ වෙතත් ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පැවති භීෂණකාරී තත්වය මත මෙසේ කටයුතු කිරීමට සිදු වූ බව පාලනාධිකාරිය දැනුම් දී ඇත. |
| (ඒ) මු.රෙ.156 (I) හා ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 29 ඡේදය | ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමකට අදාලව අධිකාරිය විසින් උපදේශන සේවා සැපයිමේදී රු.8,810,470 ( වැට් බදු රහිතව ) ක මුදලක් අයකර තිබුණද තම සේවය නිසි වගකීමකින් යුතුව ඉටු කර නොතිබුණි. |
| (ඔ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 4(1) වගන්තිය | පලාත් පාලන, කර්මාන්ත , ප්‍රවාහන, සෞඛ්‍යය අධ්‍යාපන හා වාරිමාර්ග විදුලි බල හා මහාමාර්ග විෂයන්ට අදාල අමාත්‍යාංශ 06 නියෝජනය වන පරිදි කළමනාකරණ මණ්ඩලයට නිලධාරීන් පත්කර නොතිබුණි. |
| (ඕ ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනතේ 16(1) (ඉ) වගන්තිය | අඩු වියදම් නිවාස වැඩසටහන් වලට මුදල් සැපයීම සඳහා දේපල සංවර්ධනය කරන්නන්ගේ සේවා ගාස්තු වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය විසින් එකතු කරනු ලබන සියලු මුදල් නාගරික ජනාවාස අධිකාරියෙ අරමුදල් සඳහා ලබා දිය යුතු වුවත් අධිකාරිය එසේ කර නොතිබුණි. |

1.2.7 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් ගිණුම් විෂයයන්ට අදාල ලිපිගොනු විගණනයට ඉදිරිපත් නොවුයෙන් එම ගිණුම් විෂයන් සතුටු දායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

(i) 5/2/42/2 2010 හා 5/2/4/3/2010 දරණ බලාත්මක අංශයේ ලිපිගොනු

(ii) 10/2/1465 හා 10/2/880 දරණ ඉඩම් අංශයේ ලිපිගොනු

(iii) 05/05/10/01/06/01 දරණ ලිපිගොනුව

(iv) රු. මිලියන 69 ක ගෙවීම් විස්තර ඇතුලත් මහියංගනය සංචාරක බංගලාව නවීකරණයට අදාල ලිපිගොනුව

(ආ) විගණන විමසුම් 08 ක් සඳහා පිළිතුරු එවා නොතිබුණි.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය සමාලොචනය**

**මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 4 තුලම අධිකාරිය සිය මෙහෙයුම් කටයුතු වලින් අඛණ්ඩව පාඩු ලබා තිබුණි. විස්තර පහත දැක්වේ.


රුපියල් මිලියන වලින්

| | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|
| ආදායම | 845 | 745 | 713 | 646 | 611 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 228 | 215 | 189 | 242 | 210 |
| | 1073 | 960 | 902 | 888 | 821 |
| පර්පාලන සහ පොදු වියදම් | (1189) | (913) | (862) | (878) | (675) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | (23) | (268) | (300) | (372) | (623) |
| වියදම් එකතුව | (1212) | (1181) | (1162) | (1250) | (1298) |
| මූල්‍ය පිරිවැයට පෙර මෙහෙයුම් පාඩුව | (139) | (221) | (260) | (362) | (477) |

| | | | | | |
|---|---|---|---|---|---|
| මූල්‍ය පිරිවැය | (5) | (11) | (22) | (26) | (28) |
| මූල්‍ය පිරිවැයට පසු මෙහෙයුම් පාඩුව | (144) | (232) | (282) | (388) | (505) |
| මෙහෙයුම් නොවන ආදායම | 14 | 14 | 14 | 14 | 14 |
| ඒකාබද්ධ අරමුදලට ගෙවීම | (8) | - | - | - | - |
| බදුවලට පෙර ශුද්ධ ලාභය / (පාඩුව) | (138) | (218) | (268) | (374) | (491) |
| බද්ද | (6) | (13) | (12) | (20) | (5) |
| බදුවලට පසු ශුද්ධ ලාභය / (පාඩුව) | (144) | (231) | (280) | (394) | (496) |

රුපියල් මිලියන 218ක් වූ පසුගිය වර්ෂයේ බදු පෙර අලාභය සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 138 ක අලාභයක් ලෙස රුපියල් මිලියන 80 යහපත් ප්‍රවනතාවයන් පෙන්නුම් කලද නාගරික සංවර්ධන අධිකාරිය විසින් රැස්කර නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත අනුව එම අධිකාරියට ගෙවිය යුතු රුපියල් මිලියන 136 ක මුදල එලෙස නොගෙවා අධිකාරියේ ආදායමට ගෙන තිබීම නිසා මෙම තත්ත්වය නිරූපණය වී තිබූ අතර නොඑසේ නම් වර්ෂයෙ බදු පෙර අලාභය රුපියල් මිලියන 274 ක් එනම් 26 % ක අවාසිදායක වර්ධනයක් නිරීක්ෂණය කෙරේ.

අධිකාරිය 2006 වර්ෂයේ සිට අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් එහි ශුද්ධ වත්කම් පමාණාත්මක ලෙස අඩු වෙමින් පවතින බව නිරීක්ෂණය වූ අතර මෙම තත්ත්වය අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සෘජුව බලපා තිබුණි. අධිකාරියේ ශුද්ධ වත්කම් වල පිරිහිම පහත සඳහන් සටහනෙන් පැහැදිලිව නිරූපණය වේ.



## 2.2 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 2.2.1 මූල්‍ය පාලනය

------------------

2008 ජුනි 10 දින සිට 2010 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව අධිකාරිය වෙත ලැබිතැන්පත් කළ රු.964,826 ක් වූ අගරු චෙක්පත් වටිනාකම නැවත අයකර ගැනීමට ඵලදායී පියවර ගෙන නොතිබුණි.

### 2.2.2 මානව සම්පත් කළමනාකරණයේ දුර්වලතා

----------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරයේ විවිධ තනතුරු සඳහා 2010 වර්ෂය තුල නිලධාරීන් 42 දෙනෙකුද බඳවා ගෙන තිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(i) නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගෙන් ප්‍රශස්ථ සහ ඵලදායී ලෙස සේවයක් ලබාගත හැකිවන පරිදි ප්‍රමාණවත් රාජකාරීන් පවරා නොතිබුණි.

(ii) 2010 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1,669 ක් ව අතර අවිධිමත් බඳවා ගැනිම් හේතුවෙන් තත්‍ය සේවක සංඛ්‍යාව 1,768 ක් වීම නිසා අතිරික්ත සේවක සංඛ්‍යාව 165 ක්වී තිබුණි. කෙසේ වෙතත් මෙම සංඛ්‍යාව තුල 231 ක්වූ ස්ථිර නොවන කාර්ය මණ්ඩලයක් සිටින බව නිරීක්ෂණය විය.

(iii) අතිරික්තව සිටින සේවක සංඛ්‍යාව 165ක් වුවද අනුමත සේවක සංඛ්‍යාව තුල ඇති නිත්‍ය තනතුරු වල පුරප්පාඩු 292 ක් පැවතුණි.

ආ. අධිකාරයේ මානව සම්පත් කලමනාකරණය කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මක වී නොමැති බව විගණනයේදි පහත පරිදි නිරීක්ෂණය විය.

(i) කාර්ය මණ්ඩලයේ අධ්‍යාපනික සහතික වල නිරවද්‍යතාවය තහවුරුකර නොගැනීම.

(ii) කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ පෞද්ගලික ලිපිගොනු ආරක්ෂිතව තබා නොගැනිම.

### 2.2.3 ආර්ථික නොවන ගණුදෙනු

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රුපියල් මිලියන 75 ක් වැය කර ඉදිකරන ලද හොරණ බස් නැවතුම්පොල හා එහි වූ කඩ කාමර 10 ක් 2009 මැයි 12 දින නාගරික සංවර්ධන අධිකාරිය භාරගෙන තිබුණද නෛතික ගැටළුවක් හේතුවෙන් 2010 අවසන් වන විටත් එම කඩ කාමර කුලියට දීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2002 වර්ෂයේදී රුපියල් මිලියන 16 ක් වැයකර සොන්ඩර්ස් පෙදෙසේ ඉදිකරන ලද වෙළඳ කුටි 106 කින් සමන්විත වෙළඳ සංකීර්ණය මෙම වාර්තාවේ දින දක්වා පරිහරණයට ලබා දී නොතිබුණි.

(ඇ) රු.7,361,736 ක වියදමින් රත්නපුර නගරයේ ඉදිකර ඇති රථගාල් දෙකෙහි කටයුතු නිමකර මාස 15 කට අධික කාලයක් ගත වුවද මෙම වාර්තාවේ දින දක්වා එය පරිහරණය සඳහා ලබාදී නොතබුණි.

(ඈ) මෝදර අලුත් මාවත පිහිටි අක්කර හතක පමණ ඉඩමක් තිරසර පුරවර නමැති නිවාස ව්‍යාපෘතියක් සඳහා 2001 වර්ෂයෙදි පවරා ගෙන තිබුණි. ඉඩම අත්පත්කර ගැනීමේ තැන්පත් ලෙස 2000 වර්ෂයේදී රුපියල් මිලියන 26 ක් ගෙවා ඇති අතර මේ වන විට තවදුරටත් ගෙවිය යුතු හිඟ වන්දි හා පොලී මුදල එකතුව රුපියල් මිලියන 199 ක් විය. තවද වර්ෂ 10 කට අධික කාලයක් ගත වුවද කිසිදු ව්‍යාපෘතියක් මෙම භූමියේ ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය තෙක්ම අධිකාරිය අපොහොසත් වී තිබුණි.

### 2.2.4 අධිකාරිය සතු සම්පත් වෙනත් ආයතන වෙත මුදාහැරීම

-----------------------------------------------------------

අධිකාරිය විසින් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට මෝටර් රථයක් සමඟ රියදුරෙකුද, ප්‍රවාහන අමාත්‍යාංශයට රියදුරෙකුද, කතරගම ප්‍රාදේශිය සභාවට ට්‍රැක්ටරයක්ද ලබා දී තිබුණි. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියට හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට මුදාහැර තිබූ මෝටර් රථය සඳහා ඉන්ධන සහ වෙනත් වියදම් වශයෙන් රු.40,297ක් අධිකාරිය විසින් 2010 වර්ෂය තුළ දරා තිබුණි.

**2.2.5 ඵලදායී නොවන ආයෝජන**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ඕෂන් වීව් ඩිවලොප්මන් පුද්ගලික සමාගම - රු. 92,000,000**

2005 සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොමැති අතර අදාල අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සමාගම පොදු සමාගමක් බවට පරිවර්තනය කර ආයෝජන මුදල් ආපසු ලබාගැනීමට හෝ කටයුතු කර නොමැත.

**(ආ) රිල් සමාගම - රු. 28,950,000**

2005 වර්ෂයේ සිට ප්‍රතිලාභයක් ලැබී නොමැති අතර අධිකාරිය විසින සමාගමට බදු දී ඇති ඉඩම්වල අගයෙන් 18% ක් වූ ආයෝජන සඳහා ප්‍රතිලාභයක් ලැබී නොමැත. එම ඉඩම සංවර්ධනය නොකිරීම හේතුවෙන් බදු ගිවිසුම අවලංගු කර ආපසු ලබා ගෙන නොතිබුණි.

**(ඇ) පැලියගොඩ වෙයාර් හවුස් : රු.299,999,930**

කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබූ අතර සමාගම දිගුකාලීනව අලාභ ලැබීම හේතුවෙන් වෙළඳපොල අගය අඩුවීම සඳහා 100% ක ප්‍රතිපාදනයක් කර ඇත.

**2.2.6 කළමනාකරණ අකාර්යක්ෂමතා**

----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සිදුකරනු ලැබූ නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූයේ සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේදී අයකල යුතු සේවා ගාස්තු රුපියල් මිලියන 100ක වටිනාකමින් රුපියල් මිලියන 85 ක් ම නියමිත පරිදි වාරික නොගෙවීම නිසා හිඟව පවතින බවයි. තවද ගෙවිය යුතුව තිබූ වාරික 104 ක් අතරින් ගෙවා තිබුණේ වාරික 13 ක් පමණක් බවයි. නියමිත කාලය තුලදී ගෙවීමට අපොහොසත් වී තිබූ බව සහ එම මුදල් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගැනීමට අධිකාරිය අපොහොසත්ව ඇති බවයි. තොරතුරු පහත දැක්වේ.

(ආ) ගැසට් නිවේදන අනුව අයකරනු ලබන සේවා ගාස්තු වාරික පදනම මත අයකරනු ලබන අතර ලබාදෙනු ලබන වාරික සඳහා ලබා දී ඇති කාලයට

18% ක පොළියක් අයකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කලද ආයතන 08 ක් විසින් ගෙවිය යුතු රු.9,806,287 ක පොලි මුදල් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් ණය පදනම මත සංවර්ධන අවසර පත්‍ර නිකුත්කර තිබීම හේතුවෙන් රු.94,251,659 ක ආදායමක් අහිමි වීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

(ඈ) ඉඩම් ගොඩනැගිලි විකිණීම සඳහා කලමනාකරණ තීරණ නොගැනීම හේතුවෙන් 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේ ඉඩම් සහ ගොඩනැගිලි විකිණීම 92% කින් අඩුවී තිබුණි. කෙසේ වෙතත් 2010 වර්ෂය තුලදී මැතිවරණ පැවැත්වූ හෙයින් රජයේ දේපල බදුදීම විකිණීම වැනි බැහැර කිරීම් තාවකාලිකව අත්හිටුවීම නිසා මෙම තත්වය ඇති වූ බව පාලනාධිකාරිය දැනුම් දී ඇත.

2.2.7 **මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.3,694,548 ක ආදායමක් අධිකාරියට අහිමිකරමින් මහල් 11 කින් යුත් ඉදිකිරීමකට ආවරණ අනුමැතිය ලබා දී තිබූ අතර පහත නිරීක්ෂණයන්ද කෙරේ.

i. උක්ත ගොඩනැගිල්ල සඳහා කොළඹ නගර සභාව විසින් නිකුත් කර තිබූ අනුකූලතා සහතිකය 2010 මාර්තු 10 දින අවලංගු කර තිබූ අතර එයට හේතු ලෙස දක්වා තිබුණේ කොළඹ නගර සංවර්ධන සැලැස්මට පටහැනිව අදාල ගොඩනැගිලල ඉදිකර තිබීම, දැනටමත් නේවාසික භාවිතයට යොදාගෙන තිබීම සහ අදාල සංවර්ධන අවසර පත්‍රයට පටහැනිව ඉදිකර තිබීමත්ය.

ii. ආවරණ අනුමැතියකින් නියමානුකූල කල නොහැකි මෙම ඉදිකිරීමට අදාලව ඉදිකිරීම් වැයෙන් 30% ක් වූ රු.5,541,822 ක ගාස්තුවක් අයකළ යුතු වුවද අයකිරීමට තිරණය කර තිබුණේ 10% ක් වූ රු.1,847,274 ක් වීම හේතුවෙන් අධිකාරියට රු.3,694,548 ක ආදායමක් අහිමි වී තිබුණි.

iii. ඉහත සඳහන් මුදල නිවාසයන්හි හිමිකම් ඔප්පු නිකුත් කිරීමේදී ගෙවීමේ එකඟතාවය තුල මෙම ඉදිකිරීම සඳහා අධිකාරිය විසින් 2010 මාර්තු 15 දින

නැවත සංවර්ධන බලපත්‍රයක් නිකුත් කර දින 10 කින් එනම් 2010 මාර්තු 25 දින අනුකූලතා සහතිකය නිකුත් කර තිබුණි.

iv. කොළඹ මහ නගර සභාව විසින් අනුකූලතා සහතිකය අවලංගු කිරීමට හේතු වූ කිසිදු කරුණක් නිරාකරණය වීමකින් තොරව අධිකාරිය විසින් සිය අනුකූලතා සහතිකය නිකුත්කර තිබුණි.

v. උක්ත ගොඩනැගිල්ලේ භූමි පර්මාණ අනුපාතය සහ ගොඩනැගිලි සීමාව කොළඹ නගර සංවර්ධන සැලැස්මේ අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිකර නොතිබුණු අතර ඒ හේතුවෙන් අයකර ගත යුතු දඩ මුදල් අයකළ බවට සාක්ෂි ඉදිරිපත් නොකෙරුණි.

(ආ) අධිකාරිය විසින් වෙනත් රාජ්‍ය ආයතන වෙත උපදේශක සේවා සැපයීමේදී වෘත්තීයමය හා විශ්වාසනීය ලෙස කටයුතු නොකර සදොස් ලෙස කල වැඩ සහතික කර ඇති අවස්ථා නිරීක්ෂණය විය. නිදසුනක් ලෙස ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල ඉදි කිරීමට අදාලව රුපියල් මිලියන 19 කට අධික නම නොවූ කාර්යයන් නිමකර ඇති බවට ගෙවීම් නිර්දේශ කර තිබීම හා ප්‍රගති වාර්තා ඉදිරිපත කිරීමකින් තොරව රුපියල් මිලියන 61 ක මුදලක් ගෙවීමට නිර්දේශ කිරීම දැක්විය හැක.

(ඇ) සියලු තෙත් බිම් කුඹුරු ඉඩම් හා පහත් බිම් ගොඩකිරීම අත්හිටුවමින් නිකුත් කර ඇති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 03/0867/123/013/EPC/366ට පටහැනිව බත්තරමුල්ල තලංගම වැව ආසන්නයේ පිහිටි පිඹුරුපත් අංක 2265 දරන සැලැස්ම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. මෙහිදී සැලසුම් කමිටුවක් පවත්වා නොමැති බවත්, අධිකාරියේ සැලසුම් නිලධාරියෙකු සහභාගි වී නොමැති බවත් නිරීක්ෂණය වූ අතර මේ පිළිබඳව විධිමත් පියවරයන් ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

(ඈ) අංක 65, ඩබ්.ඒ.සිල්වා මාවත, කොළඹ 06 දරණ ස්ථානයේ මහල් 02 කින් යුත් කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කොළඹ මහ නගර සභාව විසින් 2007 ජූලි 04 දින සංවර්ධන අවසර පත්‍රයක් නිකුත්කර තිබුණි. පසුව අවසරයක් නොමැතිව මහල් 05 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකර රෙදිපිළි අලෙවි ව්‍යාපාරයක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙසේ තිබියදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් ගොඩනැගිලි හිමිකරුවෙත 2006 ජූලි 17 දිනැති සංවර්ධන අවසර පත්‍රය නිකුත් කර තිබූ අතර හා 2007 ජනවාරි 22 දිනැති අනුකූලතා සහතිකයේ පිටපත් ගොඩනැගිලි හිමිකරු විසින් ඉදිරිපත් කර තිබුණි. පසුව සොයාබැලීමේදී ව්‍යාජ සංවර්ධන බල පත්‍රයක් හා අනුකූලතා සහතිකයක් සංවර්ධනකරු විසින් ඉදිරිපත් කර තිබූ බව

අනාවරණය වී තිබුණි. එම ලියවිලි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකර ඇති බව සභාපතිවරයා දැනුම් දි ඇත .

(ඉ) අම්පාර නගරයේ පිහිටි පුද්ගලික සංචාරක නිවාඩු නිකේතනයක් වෙත සංවර්ධන අවසර පත්‍රය නිකුත් කිරීමේදී නිරීක්ෂණය වු අඩුපාඩු පහත පරිදි විය.

(i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් අය කළ යුතුව තිබු රු.10,366,673ක ගාස්තුව අය නොකර සංවර්ධන අවසර පත්‍ර නිකුත් කර තිබුණි.

(ii) සංවර්ධන අවසර පත්‍රය නිකුත් කිරීමට ප්‍රථම අදාල ස්ථානයේ වර්ග මීටර 4193 ක මහල් තුනකින් සමන්විත සංචාරක නිකේතනයක් සම්පූර්ණයෙන්ම අනවසරයෙන් ඉදිකර පවත්වා ගෙන යාම.

(iii) මෙම ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ නිරවුල් භක්තිය හා පරිසර බලපත්‍ර ලබාගත් බවට සහතික කර ගැනිමකින් තොරව අවසර පත්‍රය නිකුත් කර තිබුණි.

(ඊ) ඩී ආර් විජේවර්ධන මාවත රථගාල විධිමත් පටිපාටියකින් තොරව රු.47,500 මාසික කුලියකට බාහිර තැනැත්තන්ට ලබා දි නැවතත් එම මුදල රු.30,000 දක්වා අඩුකර තිබුණි. වාහන විශාල ප්‍රමාණයක් පමණ ගාල් කළ හැකි මෙම රථගාල අධිකාරිය විසින්ම විධිමත් සුපරීක්ෂණයක් යටතේ පවත්වා ගෙන යාම තුලින් වැඩි ආදායමක් අධිකාරියට ලබා ගැනීමට කටයුතුකර නොතිබුණි.

## 2.2.8 කාර්ය සාධනය

------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇස්තමේන්තුගත පිරිවැය රුපියල් මිලියන 4751 ක් වු අධිකාරිය විසින් කරගෙන යනු ලබන ව්‍යාපෘතින් හි ඉටු කළ යුතු කාර්යයන් අතුරින් 2010 වර්ෂයේ කිසිවක් ඉටු කර නොතිබුණු ව්‍යාපෘති සංඛ්‍යාව 07 ක් විය.

(ආ) 2010 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබුණු ව්‍යාපෘති 02 ක් අත්හිටවා තිබු අතර දරා ඇති වියදම රු. 60,295,992 කි.

(ඇ) ව්‍යාපෘති 3 ක නිම කිරීමට සැලසුම්කල කාලයද ඉක්මවා ගොස් තිබුණු අතර මෙම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු ගත පිරිවැය මිලියන 90 ක් විය.

(ඈ) ඉඩම් අත්පත්කර ගැනිමේ ක්‍රියාවලිය සම්පූර්ණ නොකර ඇතැම් ව්‍යාපෘති ආරම්භකර තිබූ අතර ඒ හේතුවෙන් ඇණහිට තිබූ ව්‍යාපෘති සංඛ්‍යාව 7 ක් වූ අතර එම ව්‍යාපෘති සඳහා රුපියල් 239,177,230 ක් දරා තිබුණි.

(ඉ) බොහෝමයක් ව්‍යාපෘති සම්බන්ධයෙන් 2009 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ ප්‍රගති වාර්තාවල තත්වය 2010 වර්ෂය තුලත් එලෙසම පැවතීමෙන් අධිකාරයේ ව්‍යාපෘතිවල 2010 වර්ෂයේ කාර්ය සාධනය ඉතාමත් පහල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

## 3. අරමුණු වලට පටහැනි වියදම්

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාර් පනතේ සඳහන් අරමුණු වලට පටහැනිව අධිකාර්යට අයත් මහියංගනය වි.අයි.පි (VIP) සංචාරක බංගලාව නවීකරණය කිරීම සඳහා රුපියල් මිලියන 69 ක් වැය කර තිබුණි. තවද, 2009 අයවැය ලේඛනයට ඇතුලත් නොකර පිරිවැය ඇස්තමේන්තු සැකැසීමකින් තොරවූ මෙම ඉදිකිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අදාල විධිවිධානයන්ට පටහැනිව කටයුතු කර තිබුණු අතර කොන්ත්‍රාත් වටිනාකමට සාපේක්ෂව අමතර වැඩ ඉතා ඉහල අගයක් ගෙන තිබූ අතර එයට අවශ්‍ය උපකරණ සමඟ පසුව මෙම සංචාරක බංගලාව ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත භාරදී තිබුණි.

## 4. අයවැය පාලනය

ඇස්තමේන්තුගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කලමනාකරණ පාලන කාරකයක් වශයෙන් උපයෝගී කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 5. පද්ධති හා පාලන

විගණනයේදි නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින්වර අධිකාර්යේ සභාපතිවරයා දැනුවත් කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) පිරිස් කළමනාකරණය
(ආ) සංවර්ධන අවසර පත් නිකුත් කිරීම
(ඇ) ආදායම් ගිණුම් ගත කිරීම
(ඈ) ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීම
(ඉ) ගනුදෙනුකරුවන්ගෙන් අත්තිකාරම් ලබා ගැනීම